| | |
|---|---|
| චක්‍රලේඛ අංකය | 2025/සාමා/25 /පිරිස් |
| නිකුත් කල දිනය | 2025.09.22 |
| පෙර පැවති චක්‍රලේඛ අදාල කර ගැනීම(තිබුනේ නම්) | -- |
| නිකුත් කලේ සහ යොමු අංකය | නිසා(පිරිස්)/ප්‍රතිපත්ති/ජීඑස්(1)/60 වෙ.ix |
| චක්‍රලේඛයේ මාතෘකාව | ලං.වි.ම. සේවකයින්ගේ නිවාඩු අවලංගු කිරීම |
| මෙම චක්‍රලේඛය මගින් අවලංගු වන චක්‍රලේඛ | |


සියළුම අංශ/ශාඛා/ඒකක ප්‍රධානීන් වෙත.

<u>ලං.වි.ම. සේවකයින්ගේ නිවාඩු අවලංගු කිරීම</u>

රටට අඛණ්ඩව විදුලිය සැපයීම සම්බන්ධව ලංකා විදුලිබල මණ්ඩලයට පැවරී ඇති ජාතික වගකීම සහ 2025 සැප්තැම්බර් මස 21 දින නිකුත් කරන ලද අංක 2454/68 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් විදුලිබල සැපයීම සම්බන්ධව සියලු සේවාවන් අත්‍යාවශ්‍ය සේවා බවට පත්කර ඇති බව සැලකිල්ලට ගෙන, සේවා අවශ්‍යතාවය සලකා බලා වහාම ක්‍රියාත්මක වන පරිදි ලං.වි.ම. සියළුම සේවකයන්ගේ නිවාඩු නැවත දැනුම් දෙන තුරු අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

එසේ වුවත්, අත්‍යාවශ්‍ය හදිසි අවස්ථාවලදී අදාල ශාඛාවට/අංශයට අනුයුක්ත පළමුවන පංතියේ හෝ ඊට ඉහළ, විධායක නිලධාරියෙකුගේ අනුමැතිය මත පමණක් සේවකයින් හට නිවාඩු ලබාදිය හැකි බව මෙයින් දන්වමි.

මෙම කරුණු ඔබගේ අංශයට/ශාඛාවට/ඒකකයට අනුයුක්ත සියළුම සේවකයන්ගේ දැනගැනීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.



ඉංජිනේරු ඩබ්.එදුස්සූරිය
සාමාන්‍යාධිකාරී
ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලය,
කොළඹ 02.
2025.09.22 දින

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2454/68 - 2025 සැප්තැම්බර් මස 21 වැනි ඉරිදා - 2025.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමා විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ගරු ජනාධිපතිතුමාණන් විසින් කරන ලද නියමය**

**1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනත**

මුද්‍රාව

අනුර කුමාර දිසානායක

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, අනුර කුමාර දිසානායක වන මම, 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නිවේදනය මගින් පහත උපලේඛනයෙහි සඳහන් වන සේවාවන් සැපයීමෙහි නිරත වන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් සාමාන්‍ය ජනජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන බව සහ එකී සේවාවට අවහිරයක් හෝ බාධාවක් විය හැකි බව සැළකිල්ලට ගනිමින් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් පූර්වෝක්ත වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් බවට මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

වර්ෂ දෙදහස් විසිපහක් වූ සැප්තැම්බර් මස 21 වැනි දින අත්සන් කරන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ආචාර්ය එන්. එස්. කුමානායක,
ජනාධිපති ලේකම්.

**උපලේඛනය**

1. විදුලිබල සැපයීම සම්බන්ධව සියලු සේවාවන්

EOG 09 - 0202


1A - G 045421 — 369 (2025/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*